# ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල

# පුරප්පාඩු

## ගොඩනැගිලි වැඩ මූලික (BUILDING FOREMAN) තනතුර

ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම් :** ගණිතය විෂය සඳහා "C" සාමාර්ථයක් ඇතුළුව අ.පො.ස. (සා.පෙ.) සමත්ව තිබීම. අ.පො.ස. (උ.පෙ.) සමත්ව තිබිය යුතුය.

**වෘත්තීය සුදුසුකම් :** අදාළ ක්ෂේත්‍රයේ තාක්ෂණවේද ජාතික ඩිප්ලෝමාව (NDT) / ෆෝමන් පුහුණු ආයතනයෙන් (Institute of Foreman Training) ලබාගත් සහතික පත්‍රය / සිවිල් ඉංජිනේරු ඩිප්ලෝමාව / භූමි දර්ශන ඩිප්ලෝමාව / NCT / HNDE හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ඊට සමාන සුදුසුකමක්.

**පළපුරුද්ද :** ගොඩනැගිලි ඉදිකිරීම්, නඩත්තු කටයුතු සහ පහත සඳහන් ක්ෂේත්‍රයන්හි අධීක්ෂණ කටයුතු පිළිබඳ වසර 05 ක පළපුරුද්දක් තිබීම.

- වහල ව්‍යුහයන් නඩත්තුව.
- ජල නල කටයුතු නඩත්තුව.
- වඩු සහ පෙදරේරු කටයුතු.
- ඇලුමිනියම් පිරිසැකසුම් සහ වෑල්ඩින් කටයුතු.
- ප්‍රමාණ පත්‍ර (BOQ) සහ සැලසුම් චිත්‍ර සටහන් සකස් කිරීමේ පළපුරුද්ද.
- 'Auto Cad' හෝ ඒ හා සමාන පරිගණක මෘදුකාංග පිළිබඳ මනා දැනුමක් තිබීම.

**වයස :** වයස අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** වැටුප් කේතය: MN 3 (III ශ්‍රේණිය)

රු. 70,440/- - 10 X 1,080 - රු. 81,240/-

ඉහත වැටුපට අමතරව, රජය විසින් අනුමත කරන ලද සියලුම දීමනා ගෙවනු ලැබේ.

**සේවා නියමයන් :** ස්ථිර සහ අර්ථසාධක අරමුදල් (EPF) පදනම මත.

රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තමන් සේවය කරන ආයතන ප්‍රධානීන් මගින් තම අයදුම්පත් එවිය යුතු අතර, එහි පිටපතක් සෘජුවම එවිය යුතුය. තනතුර සඳහා තේරී පත් වුවහොත් අයදුම්කරු සේවයෙන් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයක් අයදුම්පතට අමුණා තිබිය යුතුය.

පත්කිරීමක් සිදුකිරීමේ හෝ නොකිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල් මණ්ඩලය සතු වේ.

අයදුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය. අයදුම්කරුවන් තමන්ගේ සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව සහ ඥාතීන් නොවන ඇපකරුවන් දෙදෙනෙකුගේ (02) විස්තර සහිතව සකස් කළ අයදුම්පත් **2026.07.27** දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල,**
**තලපත්පිටිය, නුගේගොඩ.**